# CONFLICT AND CONFLICT RESOLUTION

# (Part II)

# ගැටුම් සමථන ක්‍රියාවලිය

ගැටුම් සමථනය සාමාන්‍යයෙන් දීර්ඝ ක්‍රියාවලියකි.

පෞද්ගලික මෙන් ම සමාජ දේශපාලන ගැටුම්වල ද නිරීක්ෂණය කළ හැකි කරුණක් නම්, ගැටුමක් සම්පූර්ණ ලෙස විසඳීමට දුෂ්කර වුවත් ගැටුමට සාධනීය ලෙස ප්‍රවේශ වීමේ මාධ්‍ය පවතින බව ය.

ඒ අනුව

- ගැටුම් ගැන කල්තබා අනතුරු ඇඟවීම.
- ගැටුම් වැළැක්වීම.
- ගැටුම් කළමනාකරණය.
- ගැටුම් පරිවර්තනය.
- පශ්චාත් ගැටුම් - සාමය ගොඩ නැඟීම.
- ගැටුම් සමථනය.

Classwork.LK

i. ගැටුම් ගැන කල්තබා අනතුරු ඇඟවීම.

මෙය 1980 සහ 1990 දශකවල වර්ධනය වූ සංකල්පයකි.

මෙහි මූලික අදහස නම් සමාජයේ ඇති වීමට ඉඩ තිබෙන ගැටමු පිළිබඳ කලත්බා හඳුනාගෙන ඒවා ඇති වීම වැළැක්වීමට පියවර ගැනීම යි.

එසේ කිරීමේ දී ගැටුම් ඇතිවිය හැකි ස්ථාන, සමාජ කොටස් ආදිය හඳුනාගෙන ඒවා වෙතින් ගැටුම් ඇති වීමට තුඩු දිය හැකි හේතු අධ්‍යයනය කර ඒවා විසඳීමට යෝජනා සකස් කළ හැකි ය.

ClassWork.LK

ii. ගැටුම් වැළැක්වීම (Conflict Prevention)

ඉහතින් දැක්වූ ''කල්තබා අනතුරු ඇඟවීම'' ගැටුම් වැළැක්වීමේ ආරම්භක පියවරකි.

ගැටුම් ඇති වීමට ඇති සාධක, ඉඩකඩ හා ස්ථාන හඳුනාගත් පසු ඒවා ගැටුම් බවට උත්සන්න වීම වැළැක්වීම මෙහි අරමුණ වේ.

ගැටුම් වැළැක්වීමේ ආකාර දෙකක් තිබේ.

a) සරල වැළැක්වීම :- (Light prevention)

- මෙයින් කරනුයේ ගැටුමක් ප්‍රචණ්ඩ අවධියට පැමිණීම වැළැක්වීමට පියවර ගැනීමයි. රාජ්‍ය තාන්ත්‍රික මැදිහත්වීම්, සංවාද, සහමන්ත්‍රණය, සාම සාකච්ඡා, ගැටලු විසඳීමේ වැඩමුළු ආදි මාධ්‍ය මේ සඳහා යොදා ගත හැකි ය.

ClassWork.LK

b)ගැඹුරු වැළැක්වීම :- (Deep prevention)

- මෙයින් කරනුයේ ගැටුමට පාදක වන මූලහේතු සොයා ඒවාට විසඳුම් ලබා දී, ගැටුම ඇතිවීමේ ඉඩකඩ වැළැක්වීම යි.

- ආර්ථික හා දේශපාලන ප්‍රතිසංස්කරණ, සංවර්ධන ක්‍රියාමාර්ග, ආදායම් යළි බෙදායෑමේ ක්‍රියාමාර්ග, ශුභසාධන ප්‍රතිපත්ති, දේශපාලන ආයතන ගොඩ නැඟීම ආදිය මේ සඳහා යොදාගත හැකි ක්‍රියාමාර්ග යි.

## ගැටුම් කළමනාකරණය :- (Conflict Management)

- ගැටුම් කළමනාකරණය යන්නට අර්ථ දෙකක් තිබේ.

- ගැටුමක් සම්පූර්ණයෙන් විසඳීම දුෂ්කර, කල් ගන්නා ක්‍රියාවලියක් වී ඇති විට, ගැටුමේ ප්‍රචණ්ඩත්වය හා විනාශකාරී ප්‍රතිඵල පාලනය කර, එහි ව්‍යාප්තියේ පරිමාව සහ තීව්‍රතාව සීමා කිරීම, ගැටුම් කළමනාකරණය යි. එය ගැටුමේ පාදක මූලහේතුවලට විසඳුම සෙවීමට උත්සාහ ගන්නේ නැත. මේ ප්‍රවේශය මගින් ගැටුම් සැලකෙන්නේ නිෂේධනීය ප්‍රතිඵල ඇති කරන්නක් ලෙසය.

ClassWork.LK

මෙම දෙවන පළ විශය ගැටමු සැලැකෙන්නේ නිෂේධනීය බලවේගයක් ලෙස නොව සමාජයේ එකිනෙකට වෙනස් අපේක්ෂා සහ අරමුණු අතර ගැටුමක් ලෙස ය. එබැවින් කළ යුතු වන්නේ ගැටුම් ප්‍රජාතන්ත්‍රවාදී සහ සාමකාමී රාමුවක් තුළ, සංවාද සහ සාකච්ඡා මාධ්‍යයෙන් ප්‍රකාශයට පත්වන ක්‍රියාවලියක් බවට පත් කිරීම යි. මෙම මාධ්‍ය දෙකෙන් ම අපේක්ෂා කරන්නේ ගැටුමක් අර්බුදයක් බවට පත්වීම වැළැක්වීම ය.

## ගැටුම් පරිවර්තනය (Conflict Transformation)

මෙම සංකල්පය තව දුරටත් විමසා බලමු,

මෙයින් කියැවෙන්නේ ගැටුමක් සාධනීය ලෙස සමථනය කිරීම, හුදෙක් සාම ගිවිසුමකින් හෝ එක් පාර්ශ්වයක් ජය ගැනීමෙන් හෝ අත්පත් කර හැකි අරමුණක් නොව, පරිවර්තනීය ක්‍රියාවලි ගැටුම ඇතුළතින් ම සිදුවන්නක් ද වන බව යි. එනම් ගැටුම විසින් ම ගැටුමේ ගතිකත්වය, අරමුණු අභිලාෂ ද පරිවර්තනයට ලක්වේ.

ClassWork.LK

පීටර් වොලන්ස්ටීන් (1991) ට දක්වන්නේ, ගැටුම් පරිවර්තනය යනු ගැටුමේ ඓතිහාසික ක්‍රියාවලියේ දී ලැබෙන ඉගැනුම් සම්භාරයේ ප්‍රතිඵලය බව යි. ඒ අනුව සාර්ථක ලෙස සිදුවන ගැටුම් පරිවර්තනයක් යනු යුද්ධයේ අනතුර නැවත ඇති නොවන ආකාරයට ගැටුමේ පාර්ශ්වකරුවන්, ගැටුමට තුඩු දී ඇති නිමිති සහ ගැටුමෙන් අපේක්ෂිත අරමුණු වෙනස් වීම යි. ඒ අනුව ගැටුමක් සාධනීය ලෙස සමථනය කිරීමේ අලුත් අවකාශ විවෘත වේ.

ගැටුමේ පරිවර්තනය ආකාර කිහිපයකින් සිදු විය හැකි ය. ඉන් කිහිපයක් පහත සඳහන් වේ.

- ✓ පාර්ශ්වකරුවන් පරිවර්තනයට පත්වීම (Actor Transformation)
    - ගැටුමේ පාර්ශ්වකරුවන්, ආණ්ඩු, නායකයන් වෙනස්වීම සහ ඔවුන් ගැටුම දෙස දක්වන ආකල්ප වෙනස්වීමෙන් ගැටුමකට ඇති වන බලපෑම.

ClassWork.LK

- ✓ නිමිති සහ න්‍යාය පත්‍රවල පරිවර්තනය (Issue and Agenda Transformation)
    - මෙහිදී සිදුවන්නේ ගැටුමට කේන්ද්‍ර වී ඇති නිමිති සහ න්‍යාය පත්‍ර වෙනස් වීම යි.
    - උපරිමවාදී අරමුණු වෙනුවට, අතරමඟ සමාදානයකට ඉඩ සපයන අරමුණු මතු වීම, ඒක පාක්ෂික ජයග්‍රහණ වෙනුවට හවුල් සමාදාන සඳහා ඉඩකඩ මතු වීම මේ මඟින් සිදුවේ.
- ✓ ගැටුමේ නීතිරීති පරිවර්තනය (Rule Transformation)
    - ගැටුමේ පාර්ශ්වකරුවන්ගේ චර්යාවේ වෙනස්කම් සිදුවීම මෙයින් අදහස් කෙරේ.

ClassWork.Lk

✓ ව්‍යුහමය පරිවර්තනය (Structural Transformation)

- ගැටුමේ සමස්ත ව්‍යුහය, නිමිති , අරමුණු ,චර්යාව, පාර්ශව යනාදි සියල්ල පරිවර්තනය වීම යි.

**පශ්චාත් - ගැටුම් සාමය ගොඩ නැඟීම (Post Conflict - Peace Building)**

මෙයින් හැඟවෙන කරුණ නම්, සාම ගිවිසුමක් අස්සන් කිරීම හෝ යුද්ධය අවසන් කිරීම හෝ ගැටුම් සමථනය සඳහා සපයන්නේ අත්‍යවශ්‍ය පූර්ව කොන්දේසියක් පමණක් බව යි. මින් පසු මතුවන අභියෝගය වන්නේ ගැටුම යළි ඇති නොවන පරිදි ගැටුමේ පාදක හේතුවලට සාධනීය ලෙස ආමන්ත්‍රණය කරමින්, ආර්ථික-දේශපාලන ආදි ප්‍රතිසංස්කරණය සිදු කිරීම ය.

ගැටුමේ දී විනාශ වූ ප්‍රදේශ සහ සමාජ යළි ගොඩ නැඟීම, පුනරුත්ථාපනය, ප්‍රති සංවර්ධනය, ප්‍රජාවන්ට සහන සැලසීම යුක්තිය හා සාධාරණත්වය ඉටු කිරීම, ප්‍රජාවන් හා රාජ්‍යය අතර සංහිඳියාව ගොඩ නැඟීම යන මේවා පශ්චාත් ගැටුම් සාමය ගොඩ නැඟීමේ කාර්යයට අයත් වේ.

ClassWork.LK

# ගැටුම් සමථනය (Conflict Resolution)

ගැටුම් සමථනය යනු ගැටුමක් යළි ඇති නොවන පරිදි එහි මූල හේතුවලට මෙන් ම ගැටුම් සිදුවෙද්දී මතු වූ දුක් ගැනවිලිවලට ද ආමන්ත්‍රණය කරමින් සිදු කරන සාමය ගොඩ නැගීමේ ක්‍රියාවලියක් වෙතින් අත්පත් කර ගත යුතු අරමුණකි.

ClassWork.LK

ClassWork.LK